# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1838/8 - 2013 නොවැම්බර් මස 26 වැනි අඟහරුවාදා - 2013.11.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

නිවේදනය

ද්විත්ව බදුකරණයෙන් සහන සැලසීම සඳහා ද, ආදායම් මත බදු නොගෙවා පැහැර හැරීම වැළැක්වීම සඳහා ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ පලස්තීන රජය අතර, 2012.04.16 වැනි දින එළඹි, මෙහි උපලේඛනයේ දක්වා ඇති ගිවිසුම 2013.10.23 වැනි දින සම්මත කර ගන්නා ලද යෝජනාව මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති බව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම
සහ බදු පැහැර හැරීම වැළැක්වීම
සඳහා
පලස්තීන රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර
ඇතිකරගත් ගිවිසුමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව (මෙහි මින් මතු ශ්‍රී ලංකාව වශයෙන් සඳහන් වන) සහ පලස්තීන රජය (මෙහි මින් මතු පලස්තීනය වශයෙන් සඳහන් වන) ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා ගිවිසුමක් ඇතිකර ගැනීමේ අභිලාශයෙන් මතු දැක්වෙන පරිදි එකඟ වී ඇත.


1A - PG 1852 — 860 (2013/11)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1 වැනි වගන්තිය**

***ආවරණය වන තැනැත්තන්***

ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක හෝ දෙකෙහිම හෝ වාසිකයන් වන තැනැත්තන් කෙරෙහි මෙම ගිවිසුම අදාළ විය යුතු ය.

**2 වැනි වගන්තිය**

*ආවරණය වන බදු*

1. ගිවිසුම්කාර රාජ්‍යයක් වෙනුවෙන් පනවනු ලබන ආදායම් මත වන බදු වලට, ඒවා අය කෙරන ආකාරය පිළිබඳව නොසලකා මෙම ගිවිසුම අදාළ විය යුතු ය.

2. මුළු ආදායම මත හෝ එහි කොටසක් මත පනවනු ලබන සියලුම බදු, ආදායම් මත වන බදු වශයෙන් සැලකිය යුතු ය.

3. මෙම ගිවිසුම අදාළ වන්නා වූ දැනට පවතින බදු වනුයේ,

(අ) ශ්‍රී ලංකාවෙහි දී ඃ

(i) ආයෝජන මණ්ඩලයෙහි අවසරය ලද ව්‍යවසායයන්හි පිරිවැටුම මත පදනම් වූ ආදායම් බද්ද ඇතුළුව, ආදායම් බද්ද ඃ
(මෙහි මින්මතු "ශ්‍රී ලංකා බද්ද" යනුවෙන් සඳහන් වේ)

(ආ) පලස්තීන රාජ්‍යයේ දී ඃ

(i) ආදායම් බද්ද,
(මින්මතු "පලස්තීන බද්ද" යනුවෙන් සඳහන් වේ)

4. දැනට පවත්නා බදු වලට අතිරේකව හෝ ඒවා වෙනුවට මෙම ගිවිසුම අත්සන් කිරීමේ දිනයෙන් අනතුරුව ආදායම මත පනවනු ලබන කිසියම් ඒ හා සමාන වූ හෝ බෙහෙවින් සමාන වූ අනෙකුත් යම් බදු වලට ද මෙම ගිවිසුම අදාළ විය යුතු වේ. ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් ඔවුන්ගේ බදුකරණ නීති පිළිබඳව කරනු ලැබ ඇති ප්‍රධාන වෙනස්කම් සම්බන්ධයෙන් එකිනෙකාට දැනුම් දිය යුතු ය.

**3 වැනි වගන්තිය**

***පොදු අර්ථ නිරූපණ***

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගත යුතු වුවහොත් මිස ඃ

(අ) (i) "ශ්‍රී ලංකාව" යන පදයෙන් ජාත්‍යන්තර නීතියට හා ස්වකීය ජාතික ව්‍යවස්ථා සම්පාදනයට අනුකූලව ශ්‍රී ලංකාව විසින් සිය ස්වෛරී අයිතිවාසිකම් සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන හෝ මින් මතුවට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි, එහි භූමි ප්‍රදේශය, අභ්‍යන්තර ජල ප්‍රදේශ, රාජ්‍යට අයත් මුහුදු ප්‍රදේශය, ඊට ඉහළින් පිහිටි ගුවන් අවකාශය මෙන්ම අනන්‍ය ආර්ථික කළාපය සහ මහාද්වීපික තටාකය ද ඇතුළුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් දේශ සීමාව අදහස් කෙරේ ;

(ii) "පලස්තීනය" යන පදයෙන් පලස්තීන රාජ්‍යය අදහස් වන අතර එය භූගෝලීය අර්ථයෙන් ගත් කළ "පලස්තීනය" යන පදයට එහි දේශීය මුහුදු ප්‍රදේශය සහ මුහුදු පතුල සහ වෙරළාසන්න සමුද්‍රස්ථ ප්‍රදේශවල යටි පස මෙන්ම ජාත්‍යාන්තර නීතින් සහ සම්මතයන්ට අනුකූලව ස්වභාවික සම්පත් හෝ ඉහත කී ප්‍රදේශ ගවේෂණය කිරීම පිණිස පලස්තීනයට තම ස්වෛරී අයිතිවාසිකම් ක්‍රියාත්මක කළ හැකි දේශීය මුහුදු සීමාවට පිටතින් පිහිටි ප්‍රදේශය ද අදහස් කෙරේ ;

(ආ) "ගිවිසුම්කාර රාජ්‍යය" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය" යන පදවලින් පද සම්බන්ධය අනුව අවශ්‍ය වන පරිදි, පලස්තීන රාජ්‍යය හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අදහස් කෙරේ ;

(ඇ) "තැනැත්තා" යන පදයට යම් පුද්ගලයෙකු, සමාගමක් හෝ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ;

(ඈ) "සමාගම්" යන පදයෙන් සංස්ථාපිත මණ්ඩලයක් හෝ බදු කාර්යයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සලකනු ලබන යම් ආයතනයක් අදහස් කෙරේ ;

(ඉ) "එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක්" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක්" යන පදවලින් පිළිවෙලින් එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායයක් සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායයක් අදහස් කෙරේ;

(ඊ) "ජාත්‍යන්තර ගමනාගමනය" යන පදයෙන්, ගිවිසුම්කාර රාජ්‍යයක පිහිටි ව්‍යවසායයක් විසින් මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් මගින්, එම නැව හෝ ගුවන් යානය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථානයන් අතර පමණක් ක්‍රියාත්මක කරන අවස්ථා වලදී හැර, සිදු කරනු ලබන ඕනෑම ප්‍රවාහනයක් අදහස් කෙරේ;

(උ) "රටවැසියා" යන පදයෙන් ;

(i) ගිවිසුම්කාර රාජ්‍යයක ජාතිකත්වය හෝ පුරවැසිභාවය හිමි යම් පුද්ගලයෙක් ; සහ

(ii) ගිවිසුම්කාර රාජ්‍යයක බලපැවැත්වෙන නීතිය මගින් ස්වකීය නෛතික තත්ත්වය ලබන කිසියම් නෛතික තැනැත්තෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක් ;

අදහස් කෙරේ ;

(ඌ) "නිසි බලධාරියා" යන පදයෙන් ;

(i) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා ;

(ii) පලස්තීනය සම්බන්ධයෙන්, මුදල් අමාත්‍යවරයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා ;

අදහස් කෙරේ ;

(එ) "බද්ද" යන පදයෙන් පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි ශ්‍රී ලාංකීය බද්ද හෝ පලස්තීන බද්ද අදහස් වන නමුත් මෙම ගිවිසුම අදාළ වන්නා වූ බදුවලට අදාළ යම් පැහැර හැරීමක් හෝ මඟ හැරීමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු කිසියම් මුදලක් හෝ එම බදුවලට අදාළව පනවන ලද යම් දණ්ඩනයක් නියෝජනය කරන්නා වූ කිසියම් මුදලක් මෙයට ඇතුළත් නොවේ.

2. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් යම් අවස්ථාවක දී මෙම ගිවිසුම අදාළ කර ගැනීමේ දී එහි අර්ථකථනය කොට නොමැති කිනම් හෝ පදයක්, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගැනීම අවශ්‍ය වන්නේ නම් මිස, මෙම ගිවිසුමට අදාළ වන බදු කාර්යයන් සඳහා එම රාජ්‍යයේ නීති යටතේ එම අවස්ථාවේ දරන අර්ථයම දැරිය යුතු අතර, එම රාජ්‍යයේ බලපවත්නා බදු නීති යටතේ දරන අර්ථය, එම රාජ්‍යයේ අනෙකුත් නීති යටතේ එම පදයට ඇති අර්ථය ඉක්මවා අදාළ විය යුතු ය.

### 4 වැනි වගන්තිය

### *වාසිකයා*

1. මෙම ගිවිසුමෙහි කාර්යයන් සඳහා "ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයා" යන පදයෙන් එම රාජ්‍යයේ නීති යටතේ යම් තැනැත්තෙකුගේ නිත්‍ය වාසය, වාසස්ථානය, කළමනාකරණ ස්ථානය, නීතිගත වූ ස්ථානය, හෝ එවැනි සමාන ස්වභාවයක නිර්ණායක සහ එම රාජ්‍යද ඇතුළත්ව එම රාජ්‍යයේ නීතිය යටතේ බදු ගෙවීමට නියමිත යම් තැනැත්තෙකු අදහස් කරන අතර, එම රාජ්‍ය සහ එකී යම් දේශපාලන උප කොට්ඨාසයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් ඊට ඇතුළත් වේ. කෙසේ වුව ද, එම රාජ්‍යයේ ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් පමණක් එම රාජ්‍යය තුල දී බද්දට යටත්වන යම් තැනැත්තෙකු, මෙම පදයට ඇතුළත් නොවේ.

2. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන යම් පුද්ගලයෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකු වන කල්හි, ඔහු පිළිබඳ තත්ත්වය පහත සඳහන් පරිදි තීරණය කළ යුතු ය ඃ

(අ) ඔහුට ස්ථිර නිවාසයක් තිබෙන රාජ්‍යයේ පමණක් වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුට රාජ්‍යයන් දෙකෙහිම ස්ථිර නිවාසයක් තිබේ නම් ඔහු සමඟ වඩා සමීප පෞද්ගලික හා ආර්ථික සම්බන්ධතා තිබෙන (ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන) රාජ්‍යයේ පමණක් වාසිකයකු ලෙස ඔහු සලකනු ලැබිය යුතුය.

(ආ) ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වූ රාජ්‍යය නිගමනය කළ නොහැකි නම් හෝ එක් රාජ්‍යයකවත් ඔහුට ස්ථිර නිවාසයක් නොතිබේ නම්, ඔහුට සුපුරුදු වාසස්ථානයක් ඇති රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) ඔහුට රාජ්‍යයන් දෙකෙහිම සුපුරුදු වාසස්ථානයන් තිබේ නම් හෝ ඉන් එකකවත් එවැන්නක් නොතිබේ නම්, ඔහු රටවැසියෙකු වන රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඈ) ඔහු රාජ්‍යයන් දෙකෙහිම රටැසියෙකු වේ නම් හෝ ඉන් එකකවත් රටවැසියකු නොවේ නම්, මෙම ප්‍රශ්නය ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යෝන්‍ය එකඟත්වයකින් යුතුව නිරාකරණය කරගනු ලැබිය යුතු ය.

3. 1 වන ජේදයේ විධිවිධාන හේතුකොට ගෙන පුද්ගලයෙකු නොවන යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයෙකු වන කල්හි, එහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය.

*5 වැනි වගන්තිය*

*ස්ථිර ආයතනය*

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා "ස්ථිර ආයතනය" යන පදයෙන් ව්‍යවසායෙහි ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් කරගෙන යනු ලබන ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් අදහස් කෙරේ.

2. "ස්ථිර ආයතනය" යන පදයට :

(අ) කළමනාකරණ ස්ථානයක් ;
(ආ) ශාඛාවක් ;
(ඇ) කාර්යාලයක් ;
(ඈ) කර්මාන්ත ශාලාවක් ;
(ඉ) වැඩ පලක් ;
(ඊ) පතලක්, තෙල් හෝ ගෑස් ආකරයක්, ගල් වලක් හෝ ස්වාභාවික සම්පත් නිස්සාරණය කරන වෙනත් යම් ස්ථානයක් ;
(උ) වෙනත් අය සඳහා ගබඩා පහසුකම් සපයන තැනැත්තෙකුට අයත් ගුදමක් ;
(ඌ) ගොවිපලක්, වැවිලි හෝ කෘෂිකාර්මික, වන වගාවන් හෝ ඒ හා සම්බන්ධ ක්‍රියාකරකම් පවත්වගෙන යන වෙනත් ස්ථානයක් ;
(එ) විකුණුම් බෙදා හැරීම් මධ්‍යස්ථානයක් හෝ ඇණවුම ඉල්ලා සිටින හෝ ලබා ගන්නා ස්ථානයක් ලෙස යොදා ගන්නා පරිශ්‍රයක් ;

විශේෂයෙන් ඇතුළත් වේ.

3. "ස්ථිර ආයතනය" යන පදයට ඉහත අයුරින්ම මේවා ද ඇතුළත් වේ :

(අ) ගොඩනැගිලි වැඩ බිමක්, ඉදිකිරීමේ, එකලස් කිරීමේ හෝ පිහිටුවාලීමේ ව්‍යාපෘතියක් හෝ ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා භාවිතා කරනු ලබන විදීමේ වේදිකාවක් හෝ නැවක් ඒ හා සම්බන්ධ අධීක්ෂණ කටයුතු ද ඇතුළුව, එහෙත් එම වැඩ බිම, ව්‍යාපෘතිය හෝ එහි කටයුතු මාස 12ක කාල පරිච්ඡේදයක් තුළ මාස හයකට වඩා වැඩි කාලයක් පවතී නම් පමණි ;

(ආ) ව්‍යවසායක් විසින් එකී කාර්යය සඳහා සේවකයන් හෝ වෙනත් සේවක පිරිස් යොදවා උපදේශාත්මක සේවාවන් ද ඇතුළුව සේවාවන් සැපයීම, එහෙත් එබඳු ස්වභාවයේ කටයුතු රට තුළ කිසියම් දොළොස් මසක කාල පරිච්ඡේදයක් තුළ මාස 06ක් ඉක්මවන කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේද සඳහා පවතී නම් පමණි.

4. මෙම වගන්තියේ පූර්ණ විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, "ස්ථිර ආයතනය" යන පදයට :

(අ) හුදෙක් ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පහසුකම් ප්‍රයෝජනයට ගැනීම ;

(ආ) හුදෙක් ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය තොගයක් ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පවත්වාගෙන යාම ;

(ඇ) හුදෙක් වෙනත් ව්‍යවසායක් විසින් සකස් කිරීමේ කාර්යය සඳහා පමණක් ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙලඳ ද්‍රව්‍ය තොගයක් පමණක් පවත්වාගෙන යාම ;

(ඈ) හුදෙක් ව්‍යවසාය සඳහා භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ හෝ තොරතුරු රැස් කිරීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම ;

(ඉ) ව්‍යවසාය වෙනුවෙන් හුදෙක් ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නා වෙනත් යම් කටයුත්තක් කරගෙන යනු ලැබීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම ;

(ඊ) එකිනෙකට සංයුක්ත කිරීමේ ප්‍රතිඵලය වශයෙන් ස්ථිර ව්‍යාපාරික ස්ථානයේ සමස්ථ ක්‍රියාකාරිත්වය ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නේ නම්, (අ) සිට (ඉ) දක්වා උප ඡේදයන්හි සඳහන් කටුයතුවල යම් සංයුතියක් සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම ;

ඇතුළත් නොවන ලෙස සැලකිය යුතුය.

5. 1 වැනි, 2 වැනි ඡේදවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 7 වැනි ඡේදය අදාළ වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන්නා වූ තැනැත්තෙකු හැර යම් තැනැත්තෙකු, ගිවිසුම්කාර රාජ්‍යයකදී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් වෙනුවෙන් ක්‍රියා කරන අවස්ථාවක දී,

(අ) එම තැනැත්තාගේ කටයුතු 4 වැනි ඡේදයේ සඳහන් ක්‍රියාකාරකම්වලට සීමා වන්නාවූ ද, ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් මගින් ක්‍රියාත්මක කළහොත් එම ස්ථිර ව්‍යාපාරික ස්ථානය එකී ඡේදයේ විධිවිධාන යටතේ ස්ථිර ආයතනයක් බවට පත් නොකරන්නා වූ ක්‍රියාකාරකම් වන්නේ නම් හැර, ව්‍යවසාය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේ බලයක් ඇත්තාවූ ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේදී එම බලය සිරිතක් වශයෙන් ක්‍රියාත්මක කරන්නා වූ ද, තැනැත්තෙකු ; හෝ

(ආ) එවැනි බලයක් නොමැති වුවත්, ව්‍යවසාය වෙනුවෙන් විධිමත් ලෙස භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය නිකුත් කරන්නාවූ, භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොගයක් පළමු රාජ්‍යයේදී සිරිතක් වශයෙන් පවත්වාගෙන යන තැනැත්තෙකු ;

වන්නේ නම් එම තැනැත්තා ව්‍යවසාය වෙනුවෙන් ඉටු කරනු ලබන යම් ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන්, එම ව්‍යවසායට පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්ථිර ආයතනයක් ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

6. ප්‍රතිරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් හැර ගිවිසුම්කාර රාජ්‍යයක රක්ෂණ ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ වාරික එකතු කිරීම සිදු කරන්නේ නම් හෝ 7 වැනි ඡේදය අදාල වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන්නා වූ තැනැත්තෙකු හැර වෙනත් තැනැත්තෙකු මගින් එම භූමි ප්‍රදේශය තුළ පවතින අවදානම් රක්ෂණය කරන්නේ නම්, මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් නොසලකා එයට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි සලකනු ලැබිය යුතු ය.

7. ස්වකීය සාමාන්‍ය ක්‍රියා පරිපාටිය අනුව ක්‍රියා කරන තැරැව්කරුවකු, සාමාන්‍ය කොමිස් නියෝජිතයෙකු හෝ ස්වාධීන තත්ත්වයක් දරන වෙනත් යම් නියෝජිතයෙකු මගින් යම් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක එකී ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යාපාරික කටයුතු කරගෙන යන හේතුව නිසාවෙන්ම යම් ව්‍යවසායකට එකී ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් ඇති බව නොසැලකිය යුතුය. කෙසේ වුවද එවැනි නියෝජිතයෙකුගේ කටයුතු එම ව්‍යවසාය වෙනුවෙන් සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් කැප කොට ඇති විටෙක සහ නියෝජිතයා සහ ව්‍යවසාය අතර ගණුදෙනු ස්වාධීන ව්‍යවසායක් අතර ඇති කර ගත හැකිව තිබූ කොන්දේසිවලට වෙනස් ලෙස සිදු කර ඇති බව පෙන්වා ඇති විටෙක, මෙම ඡේදයේ අර්ථය තුළ ඔහු ස්වාධීන තත්ත්වයක් දරන නියෝජිතයෙකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

8. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික සමාගමක්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික සමාගමක් පාලනය කිරීම හෝ එවැනි සමාගමක් විසින් පාලනය කරනු ලැබීම (ස්ථිර ආයතනයක් මගින් හෝ වෙනත් යම් ආකාරයකට) හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යාපාරයන් කරගෙන යාම යන කරුණු නිසාවෙන්ම, එක් සමාගමක් අනෙකෙහි ස්ථිර ආයතනයක් නොවිය යුතු ය.

**6 වැනි වගන්තිය**

***නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායම***

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි නිශ්චල දේපළවලින් (කෘෂිකර්මයෙන් හෝ වන වගාවෙන් ලබන ආදායම ද ඇතුළුව) ලබන ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි බද්දට යටත් කළ හැකි ය.

2. "නිශ්චල දේපළ" යන පාඨය, ප්‍රශ්නගත දේපළ පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිය යටතේ එම පාඨය දරන අර්ථයම දැරිය යුතුය. කුමන අවස්ථාවක දී වුවද මෙම පාඨයට අයත් වන නිශ්චල දේපලවලට අනුබද්ධ වන දේපළ, පශු සම්පත් සහ කෘෂිකර්මයෙහි දී සහ වන වගාවෙහි දී පාවිච්චි කරන උපකරණ, ඉඩකඩම්, දේපළ සම්බන්ධව සාමාන්‍ය නීතියේ විධිවිධාන අදාළ වන අයිතිවාසිකම්, නිශ්චල දේපළවල භුක්තිය සහ ඛණිජ නිධි, ප්‍රභවයන් සහ වෙනත් ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම සඳහා ප්‍රතිෂ්ඨා වශයෙන් විචල්‍ය හෝ ස්ථිර ගෙවීම් ලැබීමේ අයිතිවාසිකම් ද ඇතුළත් විය යුතු ය. නැව් සහ ගුවන් යානා නිශ්චල දේපළ ලෙස නොසැලකිය යුතු ය.

3. නිශ්චල දේපළ කෙළින්ම ප්‍රයෝජනයට ගැනීමෙන්, කුලියට දීමෙන් හෝ වෙනත් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීමෙන් ලැබෙන ආදායමට ද මෙම වගන්තියේ 1 වැනි ඡේදයේ විධිවිධාන අදාල විය යුතු ය.

4. 1 වැනි සහ 3 වැනි ඡේදවල විධිවිධාන, යම් ව්‍යවසායක නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායමට ද, ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කිරීම සඳහා උපයෝගි කර ගන්නා නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායමට ද අදාළ විය යුතු ය.

**7 වැනි වගන්තිය**

***ව්‍යාපාර ලාභ***

1. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ නම් මිස, එම ව්‍යවසායෙහි ලාභ බද්දට යටත් කළ හැකි වන්නේ එකී ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණකි. ව්‍යවසාය ඉහත කී පරිදි ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන්නේ නම්, ව්‍යවසායයෙහි ලාභ අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි නමුත්, එය එම ස්ථිර ආයතනයට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට සීමා වේ.

2. 3 වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවකදී, එම ස්ථිර ආයතනය, එය ස්ථිර ආයතනයක් වන්නේ කවර ව්‍යවසායකද එම ව්‍යවසාය සමග එම තත්ත්වයන් හෝ සමාන තත්ත්වයන් යටතේ, එම කටයුතුවලම හෝ සමාන කටයුතුවල සම්පූර්ණයෙන් ස්වාධීනව නිරත වන වෙනම හා වෙනස් ව්‍යවසායක් වූයේ නම් ඊට ලැබෙතැයි අපේක්ෂා කළහැකි ලාභ, එම ස්ථිර ආයතනයට ලැබුණු ලෙස එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේදී සලකනු ලැබිය යුතු ය.

3. ස්ථිර ආයතනයක ලාභ තීරණය කිරීමේදී, විධායක සහ පොදු පරිපාලන වියදම්ද ඇතුළුව එම ස්ථිර ආයතනයේ ව්‍යාපාරික කාර්යයන් සඳහා දරන ලද වියදම් ; එම ස්ථිර ආයතනය පිහිටි රාජ්‍යයෙහි හෝ වෙනත් ස්ථානයක දී දරනු ලැබුවේ වුව ද, ඒවා අඩු කිරීම් ලෙස ඉඩ දිය යුතු ය.

4. ව්‍යාපාරයේ මුළු ලාභය එහි විවිධ කොටස්වලට බෙදා වෙන් කිරීමේ ක්‍රමය පදනම් කොට ගෙන ස්ථිර ආයතනයකට ආරෝපණය කළ යුතු ලාභ නිර්ණය කිරීම ගිවිසුම්කාර රාජ්‍යයක සිරිතක්ව පවතිනතාක් කල් මෙම වගන්තියේ (2) ඡේදයෙහි ඇති කිසිවක් එම ගිවිසුම්කාර රාජ්‍යය එසේ සිරිත් පරිදි කළ හැකි බෙදා වෙන් කිරීම මගින් බදු අය කළ හැකි ලාභ නිර්ණය කිරීමෙන් නොවැළැක්විය යුතුය. කෙසේ වුවද, අනුගමනය කරන බෙදා වෙන් කිරීමේ ක්‍රමය මෙම වගන්තියේ ඇතුළත් මූලධර්මයන්ට අනුකූල වන ප්‍රතිඵලය ඇති කරන්නක් විය යුතු ය.

5. එසේ නොකිරීමට සුදුසු හා ප්‍රමාණවත් හේතු ඇත්තේ නම් මිස, ඉහත කී ඡේදයන්හි කාර්යයන් සඳහා, වර්ෂයෙන් වර්ෂයට එකම ක්‍රමය මගින් ස්ථිර ආයතනයකට ආරෝපණය කළ යුතු ලාභය තීරණය කළ යුතු ය.

6. මෙම ගිවිසුමෙහි වෙනත් වගන්තිවල වෙනම සඳහන් කරනු ලැබ ඇති ආදායම් අයිතමයන් ලාභවලට ඇතුළත් වන අවස්ථාවකදී එකී වගන්තිවල විධිවිධාන සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධාන බල නොපෑ යුතු ය.

7. යම් ස්ථිර ආයතනයක් විසින් ව්‍යවසාය සඳහා හුදෙක් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීම හේතුවෙන් යම් ලාභයක් එකී ස්ථිර ආයතනයට ආරෝපණය නොකළ යුතු ය.

**8 වැනි වගන්තිය**

*නැව් සහ ගුවන් මගින් ප්‍රවාහනය*

1. ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා ගුවන්යානා මෙහෙයුම් කිරීමෙන් ලබන ලාභ එකී ගුවන් යානාව මෙහෙයවනු ලබන ව්‍යවසාය වාසික වන්නා වූ ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතු ය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් තුළදී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි නැව් මෙහෙයුම් කිරීමෙන් උපයනු ලබන ලාභය සඳහා ප්‍රථමයෙන් සඳහන් කරන ලද රාජ්‍යයේදී බදු අය කළ හැකි නමුත්, එසේ අය කරනු ලබන බද්ද එයින් සියයට 50 කට සමාන ප්‍රමාණයකින් අඩු කළ යුතු ය.

3. මෙම වගන්තියේ කාර්යය සඳහා, ජාත්‍යන්තර ගමනාගමනයෙහි භාවිතා කරන නැව් හෝ ගුවන් යානා මෙහෙයුම් සිදු කිරීමෙන් ලබන ලාභයෙහි අවස්ථාවෝචිත පරිදි එකී කුලිය හෝ එහි භාවිතය, නඩත්තුව හෝ කුලිය ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා නැව් හෝ ගුවන් යානා මෙයෙයුම් සඳහා ආනුශංගික වන්නේ නම්,

(අ) හිස් යාත්‍රා පදනම මත බද්දට දුන් නැව් හෝ ගුවන් යානා, මගින් උපයනු ලබන ලාභය සහ

(ආ) භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන බහාලුම් භාවිතා කිරීම, නඩත්තු කිරීම හෝ බද්දට දීමෙන් (බහාලුම් ප්‍රවාහනය සඳහා ට්‍රේලර් සහ අදාල උපකරණවලින් ලැබෙන ලාභය ද ඇතුළත්ව)

උපයනු ලබන ලාභය අන්තර්ගත වේ.

4. කිසියම් සංචිතයකට සහභාගීවීමෙන්, බද්ධ ව්‍යාපාරයකින් හෝ ජාත්‍යන්තර මෙහෙයුම් නියෝජිතායතනයකින් ලැබෙන ලාභවලට ද 1 වැනි, 2 වැනි හා 3 වැනි ඡේදවල විධිවිධාන අදාළ විය යුතු ය.

**9 වැනි වගන්තිය**

*සම්බන්ධිත ව්‍යවසායන්*

1. (අ) ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණය, පාලනය හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගී වන ; හෝ

(ආ) එකම තැනැත්තන් එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනයට සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගී වන අවස්ථාවක සහ ඒ අවස්ථා දෙකින් කවර අවස්ථාවකදී වුවද, ස්වාධීන ව්‍යවසායයන් අතර පවත්නා වාණිජ්‍ය හා මූල්‍ය සම්බන්ධතා පිළිබඳ කොන්දේසිවලට වෙනස් කොන්දේසි ඒ ව්‍යවසායන් දෙක අතර පිළියෙළ කර හෝ පනවා ඇති කල්හි, ඒ කොන්දේසි නොතිබුණි නම් ඒ ව්‍යවසායන්ගෙන් එකකට උපචිත විය හැකි වූ නමුත්, ඒ කොන්දේසි නිසා එසේ උපචිත නොවූ කවර ලාභ වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක් මගින් එම ව්‍යවසායයේ ලාභවලට ඇතුලත් කර, ඒ අනුව ලාභ මත බදු අය කළ හැකි ය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් එහි ව්‍යවසායක ලාභයෙහි ඇතුළත් කරනු ලබන සහ බද්දට යටත් කරනු ලබන ලාභ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක ලාභයෙහි ඇතුළත් කරනු ලැබ එහි බද්දට යටත් කරනු ලැබ ඇති අවස්ථාවකදී, සහ එසේ ඇතුළත් කරනු ලැබූ ලාභය, ව්‍යවසායන් දෙක අතර ඇති කරන ලද කොන්දේසි ස්වාධීන ව්‍යවසායයන් අතර ඇති කර ගත හැකිව තිබූ කොන්දේසිම වන විටක, පළමුව සඳහන් කළ ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායට උපචිත විය හැකිව තිබූ ලාභ වන්නේ නම්, එවිට එම ලාභ මත අය කරනු ලබන බදු ප්‍රමාණයට යෝග්‍ය ගැලපුමක් එම අනෙක් රාජ්‍යය විසින් කළ යුතු ය. එවැනි ගැලපුමක් තීරණය කිරීමේදී මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධාන කෙරෙහිද නිසි අවධානය යොමු කළ යුතු අතර, අවශ්‍ය වන්නේ නම්, ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධරීන් එකිනෙකා විමසිය යුතු වන්නේය.

3. බදු වංචා සම්බන්ධයෙන් 2 වැනි ඡේදයේ සඳහන් විධිවිධාන අදාල නොවේ.

**10 වැනි වගන්තිය**

*ලාභාංශ*

1. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන ලාභාංශ එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වුවද, ලාභාංශ ගෙවන සමාගම වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිවලට අනුකූලවද එවැනි ලාභාංශවලින් බදු අය කළ හැකි නමුත්, ලාභාංශවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අය කරන බද්ද ; දළ ලාභාංශ ප්‍රමාණයෙන් 10% නොඉක්මවිය යුතු ය. ලාභාංශ ගෙවනු ලබන සමාගමේ ලාභ සම්බන්ධයෙන් සමාගමෙන් බදු අය කිරීමේදී මෙම ඡේදයෙහි විධිවිධාන බල නොපෑ යුතු ය.

3. මෙම වගන්තියෙහි යොදා ගනු ලැබ ඇති පරිදි "ලාභාංශ" යන පදයෙන් කොටස් වලින් ලබන ආදායමක් හෝ ණය මුදල් වෙනුවෙන් වන හිමිකම්පෑමක් නොවන්නා වූ වෙනත් අයිතිවාසිකමක් මත ලබන ආදායමක් වන්නා වූ ද, ලාභයට සහභාගී වන්නාවූ ද, රාජ්‍යයේ බලපවත්නා නීතියට අනුව යම් වාසික සමාගමක් කොටස් බෙදා හරිනු ලබන විටකදී අදාල සමාන බදුකරණ රීතීන්ට යටත් වන්නාවූ සංස්ථාපිත අයිතිවාසිකම්වලින් ලැබෙන ආදායම් ද අදහස් කෙරේ.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු වන්නාවූ, ලාභාංශවල ආර්ථලාභී හිමිකරු, ලාභාංශ ගෙවන සමාගම වාසික වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් සහ එහි පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පෞද්ගලික සේවාවක් එම අනෙක් රාජ්‍ය තුළ ඉටු කරනු ලබන්නේ නම්, සහ ලාභාංශ ගෙවනු ලබන කොටස් දැරීම එකී ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමග ඵලදායී ලෙස සම්බන්ධව පවතින්නේ නම්, මෙම වගන්තියේ 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධාන අදාල නොවිය යුතු ය. එවැනි අවස්ථාවන්හිදී අවස්ථාවෝචිත පරිදි 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ලාභ හෝ ආදායම් උපයන අවස්ථාවකදී, එම සමාගම එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකුට ලාභාංශ ගෙවනු ලබන විටෙක හෝ එම අනෙක් රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයකට හෝ ස්ථාවර පදනමකට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇති කොටස් දැරීමක් සම්බන්ධයෙන් වන විටෙක හැර, සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ සම්බන්ධයෙන් බදු කිසිවක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් නොපනවා සිටිය හැකිවාක් මෙන්ම, සමාගමේ ගෙවන ලද ලාභාංශ හෝ නොබෙදූ ලාභ එම අනෙක් රාජ්‍යයෙහි පැන නගින ලාභ හෝ ආදායම්වලින් මුළුමනින්ම හෝ අඩ වශයෙන් සමන්විත වන්නේ වුවද සමාගමේ නොබෙදූ ලාභ, සමාගමේ නොබෙදූ ලාභ මත වන බද්දකට භාජනය නොකර ද සිටිය හැකි ය.

6. ලාභාංශ ගෙවනු ලබන කොටස් හෝ අනෙකුත් අයිතිවාසිකම් ඇති කිරීම හෝ පවරා දීම මගින් මෙම වගන්තියෙන් වාසි ලබා ගැනීම ; එසේ ඇති කිරීම හෝ පවරා දීම සඳහා සම්බන්ධ යම් පුද්ගලයෙකුගේ ප්‍රධාන පරමාර්ථය හෝ ප්‍රධාන පරමාර්ථ අතුරින් එකක් වන්නේ නම් ; එහිදී මෙම වගන්තියෙහි විධිවිධාන අදාළ නොවේ.

## 11 වැනි වගන්තිය

### *පොළී ආදායම*

1. ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගත වන පොළිය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විටකදී එම පොළිය එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වුවද, එම පොළිය එය උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයෙහිදී ද, එම රාජ්‍යයේ නීතිය අනුව බදු අය කළ හැකි නමුත්, පොළියේ අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වේ නම්, එසේ අයකරනු ලබන බද්ද දළ පොළී ප්‍රමාණයෙන් සියයට 10ක් නොඉක්ම විය යුතු ය.

3. 2 වැනි ජේදයේ විධිවිධාන නොසලකා, ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගතවන වන්නා වූ, සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ රජය, දේශපාලන උප කොට්ඨාශයක්, ප්‍රදේශීය බල මණ්ඩලයක් ද ඇතුළුව, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ එකී රාජ්‍යයට පූර්ණ වශයෙන් අයත් වන්නාවූ හෝ එමගින් පාලනය කරන මූල්‍ය ආයතනයකින් උපයනු ලබන පොළිය පළමුව සඳහන් කළ රාජ්‍යයේදී බද්දෙන් නිදහස් විය යුතු ය.

4. මෙම වගන්තියේ යෙදී තිබෙන "පොළිය" යන පදයෙන් උකසක් මගින් ඇප තබා ඇති හෝ නැති, ණය ගැතියාගේ ලාභවලට සහභාගීවීමේ අයිතිවාසිකම් සහිත හෝ රහිත, සියලු වර්ගයන්හි ණය හිමිකම්වලින් ලැබෙන ආදායම සහ විශේෂයෙන් රජයේ ඇපකරවලින් සහ බැඳුම්කර හෝ ණය පත්‍රවලින් ලැබෙන අධි මිල සහ ත්‍යාග ඇතුළත් ආදායම අදහස් වේ. මෙම වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාද ගෙවීම් වෙනුවෙන් අය කරන දඩ මුදල පොළිය ලෙස සලකනු නොලැබිය යුතු ය.

5. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන පොළියෙහි අර්ථලාභී හිමිකරු, පොළිය උද්ගතවන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන්නේ නම් හෝ එහි පිහිටා ඇති ස්ථාවර පදනමක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍ය තුළදී ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කරන්නේ නම් සහ පොළිය ගෙවනු ලබන ණය හිමිකම, එකී ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමග ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම්, එවන් අවස්ථාවන්හිදී 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධාන අදාල නොවන අතර, අවස්ථාවෝචිත පරිදි 7 වැනි වගන්තියෙහි හෝ 14 වැනි වගන්තියෙහි විධිවිධාන අදාළ වේ.

6. පොළිය ගෙවන්නා ගිවිසුම්කාර රාජ්‍යයම හෝ එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් හෝ එම රාජ්‍යයේ වාසිකයෙකු වන කල්හි, පොළිය එම ගිවිසුම්කාර රාජ්‍යයේදී උද්ගත වන ලෙස සැලකිය යුතු ය. කෙසේ වෙතත්, පොළී ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුවද, නොවුව ද, ඔහුට පොළිය ගෙවීමට උපචිත වීමට අදාළ වූ ණයගැති භාවය හා සම්බන්ධ වූ ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක තිබෙන අවස්ථාවකදී සහ එම පොළිය දරනු ලබන්නේ එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් නම්, එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම තිබෙන රාජ්‍යයේ දී එම පොළිය උද්ගත වන ලෙස සැලකිය යුතු ය.

7. ගෙවන්නා සහ අර්ථලාභී හිමියා අතර හෝ ඔවුන් දෙදෙනා සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධයක් නිසා, එය ගෙවනු ලබන ණය හිමිකම් සැලකිල්ලට ගනිමින්, ගෙවනු ලබන පොළී ප්‍රමාණය, එවැනි සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී ගෙවන්නා සහ අර්ථලාභී හිමිකම් ඇති තැනැත්තා විසින් එකඟ විය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන්නේ නම්, කුමන හේතුවක් මත වුවද මෙම වගන්තියේ විධිවිධාන බල පැවැත්විය යුත්තේ අවසානයට සඳහන් කළ ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක, ගෙවීම් වල අතිරික්ත කොටස, මෙම ගිවිසුමේ අනෙක් විධිවිධාන සුදුසු පරිදි සැලකිල්ලට ගනිමින් ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව තවදුරටත් බදුවලට යටත් කළ යුතු ය.

8. පොළිය ගෙවනු ලබන ණය හිමිකම ඇති කිරිම හෝ පවරා දීම මගින් මෙම වගන්තියේ වාසි ලබා ගැනීම, එසේ ඇති කිරීම හෝ පවරා දීම සඳහා සම්බන්ධ යම් පුද්ගලයෙකුගේ ප්‍රධාන පරමාර්ථය හෝ ප්‍රධාන පරමාර්ථ අතුරින් එකක් වන්නේ නම්, එහිදී මෙම වගන්තියෙහි විධිවිධාන අදාල නොවේ.

**12 වැනි වගන්තිය**

*රාජ්‍ය භාග*

1. ගිවිසුම්කාර රාජ්‍යයක උද්ගත වන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වෙත ගෙවන රාජ්‍ය භාග, ඒ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වෙතත්, එම රාජ්‍ය භාග, ඒවා උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයේදී ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව බද්දට යටත් කළ හැකි වේ. එහෙත් රාජ්‍ය භාගවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකු වන්නේ නම්, එසේ අය කෙරෙන බද්ද එම රාජ්‍ය භාගවල දළ ප්‍රමාණයෙන් සියයට 10 නොඉක්මවිය යුතු ය.

3. මෙම වගන්තියේ යොදා ඇති පරිදි "රාජ්‍ය භාග" යන පදයෙන් පරිගණක මෘදුකාංග, සිනමා රූපක චිත්‍රපට හෝ ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශනය සඳහා යොදා ගන්නා පටල, හඬ පටි ඇතුළු කිසියම් සාහිත්‍යමය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතියක ප්‍රකාශන අයිතියක්, පේටන්ට් බලපත්‍රයක්, වෙළෙඳ ලකුණක්, මෝස්තරයක් හෝ ආදර්ශකයක්, පිඹුරක්, රහස්‍ය වට්ටෝරුවක් හෝ ක්‍රියාවලියක් පාවිච්චි කිරීමට හෝ පාවිච්චි කිරීමේ අයිතිය සඳහා හෝ කාර්මික, වාණිජමය හෝ විද්‍යාත්මක උපකරණ හෝ කාර්මික, වාණිජමය හෝ විද්‍යාත්මක අත්දැකීමක් සම්බන්ධ තොරතුරු, පාවිච්චි කිරීමට හෝ පාවිච්චි කිරීමේ අයිතිය සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලැබුණු ඕනෑම වර්ගයක ගෙවීම් අදහස් කෙරේ.

4. රාජ්‍ය භාගවල අර්ථලාභී හිමිකරු ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකුව, රාජ්‍ය භාග උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරයක් කරගෙන යන අවස්ථාවක හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පුද්ගලික සේවා සිදු කරනු ලබන අවස්ථාවක සහ රාජ්‍ය භාග ගෙවනු ලබන්නේ කවර අයිතිවාසිකමක් හෝ දේපළක් සම්බන්ධයෙන් ද, එම අයිතිවාසිකම හෝ දේපළ, එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ ක්‍රියාකරී ලෙස සම්බන්ධ වී ඇත්නම්, මෙම වගන්තියේ 1 වැනි සහ 2 වැනි ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

5. (අ) රාජ්‍ය භාග ගෙවන්නා එම රාජ්‍යයේම, දේශපාලන උප කොට්ඨාශයක්, ප්‍රාදේශීය බල මණ්ඩලයක් හෝ එම රාජ්‍යයේ වාසිකයෙකු වන කල්හි, රාජ්‍ය භාග එම ගිවිසුම්කාර රාජ්‍යයේ උද්ගත වන ලෙස සැලකිය යුතුය. කෙසේ වෙතත් රාජ්‍ය භාග ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුව ද, නොවූ ව ද, රාජ්‍ය භාග ගෙවීමේ වගකීම හා බැඳුනු ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක ඔහු සතුව තිබේ නම්, සහ එම රාජ්‍ය භාග එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් දරනු ලබන්නේ නම්, එවිට ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම පිහිටි රාජයේදී එම රාජ්‍ය භාග හෝ තාක්ෂණ සේවා ගාස්තු උද්ගත වන ලෙස සැලකිය යුතු ය.

(ආ) (අ) උප ඡේදය යටතේ එකදු ගිවිසුම්කාර රාජ්‍යයක හෝ රාජ්‍ය භාග උද්ගත නොවන සහ එක් ගිවිසුම්කාර රාජ්‍යයක රාජ්‍ය භාග භාවිතා කිරීම, භාවිතා කිරීමේ අයිතිය, අයිතිවාසිකම් හෝ දේපළට හා සපයනු ලබන සේවාවට සම්බන්ධ වන විට, එකී ගිවිසුම්කාර රාජ්‍යයේදී එම රාජ්‍ය භාග උද්ගත වන ලෙස සැලකිය හැක.

6. ගෙවන්නා සහ අර්ථලාභී හිමියා අතර හෝ ඔවුන් දෙදෙනාම සහ වෙනත් යම් තැනැත්තකු අතර පවත්නා විශේෂ සම්බන්ධතාවයක් නිසා, පාවිච්චිය, අයිතිවාසිකම හෝ තොරතුරු සැලකිල්ලට ගනිමින්, ගෙවනු ලබන රාජ්‍ය භාග එවැනි සම්බන්ධතාවයක් නොමැති විට ගෙවන්නා සහ ලබන්නා විසින් එකගවිය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන විට, කුමන හේතුවක් මත වුවද මෙම වගන්තියේ විධිවිධාන අදාළ විය යුත්තේ අවසානයට සඳහන් ප්‍රමාණයට පමණි. මෙම ගිවිසුමේ අනෙක් විධිවිධානයන් කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින්, එම අවස්ථාවේදී, ගෙවීම්වල අතිරික්තය එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුකූලව තවදුරටත් බද්දට යටත් විය යුතු ය.

7. රාජ්‍ය භාග ගෙවනු ලබන අයිතිවාසිකම් ඇති කිරීම හෝ පවරා දීම මගින් මෙම වගන්තියෙන් වාසි ලබා ගැනීම ; එසේ ඇති කිරීම හෝ පවරා දීම සඳහා සම්බන්ධ වන යම් පුද්ගලයෙකුගේ ප්‍රධාන පරමාර්ථය හෝ ප්‍රධාන පරමාර්ථ අතුරින් එකක් වන්නේ නම් ; එහිදී මෙම වගන්තියෙහි විධිවිධාන අදාල නොවේ.

### 13 වැනි වගන්තිය

### *ප්‍රාග්ධන ලාභ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, මෙම ගිවිසුමෙහි 6 වැනි වගන්තියෙහි සඳහන් වූ ද, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටියා වූ ද, නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් උපයා ගන්නා ලද ලාභ, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථිර ආයතනයක ව්‍යාපාර දේපළ වලින් කොටසක් වන චංචල දේපළ අන්සතු කිරීමෙන් හෝ ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථාවර පදනමකට අදාළව ස්වාධීන පුද්ගලික සේවා සැපයීම සඳහා පවතින චංචල දේපළ අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, එම ස්ථිර ආයතනය (එය පමණක් හෝ සම්පූර්ණ ව්‍යවසාය සමඟ) හෝ එකී ස්ථාවර පදනම අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ ද ඇතුළුව, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අන්තර් ජාතික ගමනා ගමනයෙහි යොදවන ලද නැව් හෝ ගුවන් යානා, එවැනි නැව් හෝ ගුවන් යානා මෙහෙයවීමට අදාළ චංචල දේපළ, අන්සතු කිරීමෙන් ලබන ලාභ, බද්දට යටත් කළ හැක්කේ එම රාජ්‍යයේදී පමණි.

4. සමාගමක ප්‍රාග්ධන ස්කන්ධ කොටස් අන්සතු කිරීමෙන් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් ලබා ගන්නා, ගිවිසුම්කාර රාජ්‍යයක පිහිටි නිශ්චල දේපළවලින් ඍජුව හෝ වක්‍රව ප්‍රධාන වශයෙන්ම ලැබෙන්නාවූ, ලාභ එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

5. 4 වැනි ඡේදයේ සඳහන් නොවූ ; සමාගමක කොටස්වලින් 25% හෝ වැඩි ප්‍රමාණයක් නියෝජනය වන ; සමාගමක ස්කන්ධ සහ කොටස් අන්සතු කිරිමෙන් ලැබෙන ලාභය, ඒවා නිකුත් කරනු ලැබ ඇති ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ හැකි ය.

6. ඉහත ඡේදවල සඳහන් ඒවා හැර වෙනත් ඕනෑම දේපළක් අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ එසේ අන්සතු කරන්නා වාසිකයකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

7. "අන්සතු කිරිම" යන්නට දේපළ විකිණීම, හුවමාරුව, මාරු කිරීම හෝ දේපළ අත්හැර දැමීම හෝ එහි පවතින යම් අයිතියක් නිවාරණය කිරීම හෝ අදාල ගිවිසුම්කාර රාජ්‍යයන්හි බල පවත්නා ඕනෑම නීතියක් යටතේ අනිවාර්යෙන් අත්පත් කර ගැනීම අදහස් කෙරේ.

### 14 වැනි වගන්තිය

### *ස්වාධීන පෞද්ගලික සේවා*

1. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී ද බද්දට යටත් කළ හැකි පහත සඳහන් අවස්ථාවලදී හැර, වෘත්තීය සේවා හෝ සමාන ස්වභාවයේ වෙනත් ස්වාධීන ක්‍රියාකාරකම් වෙනුවෙන් ගිවිසුම්කාර රාජ්‍යයක වාසික පුද්ගලයෙකු විසින් ලබන ආදායම, එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(අ) තම කටයුතු ඉටුකර ගැනීම සඳහා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථාවර පදනමක් නිරන්තරව ඔහුට ඇති කල්හි, එම ස්ථාවර පදනම සඳහා ආරෝපණය කළ හැකි ආදායම අනෙක් රාජ්‍යයේ බද්දට යටත් කළ හැකි ය.

(ආ) මාස 12 ක කාල පරිච්ඡේදයක් තුළදී එකතුව දින 183 ක් ඉක්මවන කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් තුළ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ගත කරන විට එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී සිය කටයුතුවලින් ලබන ආදායම පමණක් එම ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකි ය.

2. "වෘත්තීය සේවා" යන පදයට ස්වාධීන, විද්‍යාත්මක, සාහිත්‍යමය, කලාත්මක, අධ්‍යාපනික හෝ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් මෙන්ම වෛද්‍යවරුන්ගේ, නීතිඥයින්ගේ, ඉංජිනේරුවරුන්ගේ, ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ, දන්ත වෛද්‍යවරුන්ගේ සහ ගණකාධිකාරිවරුන්ගේ ස්වාධීන ක්‍රියාකාරකම් ද විශේෂයෙන් ඇතුළත් වේ.

### 15 වැනි වගන්තිය

#### *පරායත්ත පෞද්ගලික සේවා*

1. මෙම ගිවිසුමෙහි 16, 18, 19, හා 20 වැනි වගන්ති වල විධිවිධානයන්ට යටත්ව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සේවා නියුක්තියක් වෙනුවෙන් උපයන වැටුප්, වේතන සහ එවැනි වෙනත් පාරිශ්‍රමිකයන්, එකී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි නොවන්නේ නම් එකී රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් විය යුතු ය. එසේ සේවා නියුක්තියෙහි යෙදෙන්නේ නම්, එම සේවා නියුක්තියෙන් උපයන ලද පාරිශ්‍රමික එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

2. මෙම වගන්තියෙහි 1 වැනි ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි යෙදෙන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් උපයනු ලබන පාරිශ්‍රමිකය,

(අ) එම පාරිශ්‍රමිකය ලබන්නා අදාළ මූල්‍ය වර්ෂයෙන් ආරම්භ වන හෝ අවසන් වන ඕනෑම දොළොස් මාසයක කාල පරිච්ඡේදයක් තුළ එකතුව දින 183 කට නොවැඩි කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින්නේ නම් ; සහ

(ආ) එම පාරිශ්‍රමිකය, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු නොවන සේවා යෝජකයෙකු විසින් හෝ වෙනුවෙන් ගෙවනු ලබන්නේ නම් ; සහ

(ඇ) එම පාරිශ්‍රමිකය සේවා යෝජකයාට, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයකින් හෝ ස්ථාවර පදනමකින් දරනු නොලබන්නේ නම්,

එකී පළමුව සඳහන් කළ රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතු ය.

3. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් තුළ කරනු ලබන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් උපයනු ලබන පාරිශ්‍රමිකය, එම ගුවන් යානය හෝ නැව මෙහෙයවනු ලබන ව්‍යවසාය වාසික වන ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

### 16 වැනි වගන්තිය

#### *අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් හෝ වෙනත් ඒ හා සමාන තත්ත්වක් දැරීමෙන් උපයන අධ්‍යක්ෂ ගාස්තු හා ඊට සමාන ගෙවීම් එම අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන සමාගමක ඉහළ කළමනාකරණ තත්ත්වයේ නිලධාරියෙකු වශයෙන් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් ලබන වැටුප්, වේතන සහ ඒ හා සමාන වෙනත් පාරිශ්‍රමික එකී අනෙකුත් රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකි ය.

### 17 වැනි වගන්තිය

#### *කලා ශිල්පීන් සහ ක්‍රීඩකයන්*

1. මෙම ගිවිසුමෙහි 14 වැනි සහ 15 වැනි වගන්තිවල විධිවිධානයන්හි කුමක් සඳහන් වූවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු නාට්‍ය, චලන චිත්‍රපට, ගුවන් විදුලි හෝ රූපවාහිනී ශිල්පියකු වැනි කලා ශිල්පියෙකු හෝ සංගීතඥයකු හෝ ක්‍රීඩකයකු වශයෙන් ස්වකීය පෞද්ගලික ක්‍රියාකාරකම්වල අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී නිරත වීමෙන් උපයනු ලබන ආදායම, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කලා ශිල්පියෙකු හෝ ක්‍රීඩකයකු විසින් එබඳු ස්වකීය පෞද්ගලික කටයුතු වල නිරතවීම සම්බන්ධයෙන් වන ආදායම, එම කලා ශිල්පියාටම හෝ ක්‍රීඩකයාටම නොව, වෙනත් තැනැත්තෙකුට උපචිත වන අවස්ථාවකදී, එම ආදායම, මෙම ගිවිසුමෙහි 7 වැනි, 14 වැනි සහ 15 වැනි වගන්තිවල කුමක් සඳහන් වුවද, කලා ශිල්පියාගේ හෝ ක්‍රීඩකයාගේ කටයුතු ක්‍රියාත්මක වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

3. 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 1 වැනි ඡේදයෙහි සඳහන් ක්‍රියාකාරකම්වලින් උද්ගත වන ආදායම ගිවිසුම්කාර රාජ්‍යයන් අතර පවතින සංස්කෘතික ගිවිසුමක් හෝ වැඩ පිළිවෙලක් යටතේ සිදු වුවක් වන විට සහ එම සංචාරය සඳහා ආධාර පූර්ණ හෝ ප්‍රමාණවත් වශයෙන් ගිවිසුම්කාර රාජ්‍යයන් අතුරින් එකක හෝ එහි පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය ආයතනයක් හෝ ලබා දී ඇති විට එම ක්‍රියාකාරකම් සිදුවන ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දෙන් නිදහස් කළ යුතු ය.

**18 වැනි වගන්තිය**

***විශ්‍රාම වැටුප්***

1. මෙම ගිවිසුමෙහි 19 වැනි වගන්තියේ 2 වැනි ජේදයේ විධිවිධානයන්ට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය තුළ ඔහුගේ පසුගිය සේවා නියුක්තිය හෝ සේවය සැලකිල්ලට ගෙන, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ප්‍රභවයක් මගින් විශ්‍රාම වැටුප් සහ ඊට සමාන පාරිශ්‍රමික ගෙවන අවස්ථාවක, එම විශ්‍රාම වැටුප් සහ ඒ හා සමාන පාරිශ්‍රමික එකී අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැක.

2. මෙම වගන්තියෙහි 1 වැනි ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක සමාජ ආරක්ෂණ පද්ධතියක් යටතේ ගෙවන ලද විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ගෙවීම් එම ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතු ය.

**19 වැනි වගන්තිය**

***ආණ්ඩුවේ සේවය***

1. (*අ*) ගිවිසුම්කාර රාජ්‍යයක්, එහි දේශපාලන උප කොට්ඨාසයක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් එම රාජ්‍යය වෙත, දේශපාලන උප කොට්ඨාශය වෙත හෝ අධිකාරිය වෙත ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන විශ්‍රාම වැටුප් නොවන ; වැටුප්, වේතන සහ වෙනත් සමාන පාරිශ්‍රමික එම රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(*ආ*) කෙසේ වුවද, එම සේවාවන් ඉටු කරන ලද්දේ අනෙක් රාජ්‍යයෙහි දී නම් සහ එකී පුද්ගලයා ඃ

(i) එම අනෙක් රාජ්‍යයේ ජාතිකයෙකු වන ; හෝ

(ii) හුදෙක් එම සේවාවන් ඉටු කිරීමේ කාර්යය සඳහා එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු බවට පත් වූ නැතැත්තෙකු නොවන ;

එම රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එවැනි වැටුප්, වේතන හා වෙනත් සමාන පාරිශ්‍රමිකයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

2. (*අ*) ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උප කොට්ඨාසයක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ ඒවායින් ඇති කරන ලද අරමුදල්වලින් එම ගිවිසුම්කාර රාජ්‍යය වෙත දේශපාලන උප කොට්ඨාශය වෙත හෝ පළාත් පාලන ආයතනයක් වෙත ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපක් එම රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(*ආ*) කෙසේ වුවද, එවැනි තැනැත්තෙකු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු සහ ජාතිකයකු වන්නේ නම් එවැනි විශ්‍රාම වැටප් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක් එහි දේශපාලන උප කොට්ඨාසයක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඉටු කරන ලද සේවාවන්ට අදාළ වන වැටුප්, වේතන හා වෙනත් සමාන පාරිශ්‍රමිකයන් සහ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් 15, 16, 17 සහ 18 යන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

**20 වැනි වගන්තිය**

***ගුරුවරුන් සහ පර්යේෂකයන්***

1. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයට පැමිණීමට පූර්වාසන්නයෙහි, ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වූ හෝ වන මහාචාර්යවරයෙකු, ගුරුවරයෙකු හෝ පර්යේෂකයෙකු, ඉගැන්වීම හෝ පර්යේෂණ පැවැත්වීම හෝ එම කාර්යයන් දෙකම සඳහා එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ විශ්ව විද්‍යාලයක, විද්‍යාලයක හෝ වෙනත් සමාන අනුමත ආයතනයක එවැනි ඉගැන්වීම හෝ පර්යේෂණ පැවැත්වීම වෙනුවෙන් ලබන ඕනෑම පාරිශ්‍රමිකයක්, එම අනෙක් රාජ්‍යයට, ඔහු/ඇය පැමිණි දින සිට වසර තුනක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා එකී අනෙක් රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

2. යම් තැනැත්තෙකු විසින් සිදු කරනු ලබන පර්යේෂණ මූලික වශයෙන් වෙනත් පෞද්ගලික තැනැත්තෙකුගේ හෝ තැනැත්තන්ගේ යහපත සඳහා නොව පොදු යහපත සඳහා වන්නේ නම් පමණක් එවැනි පර්යේෂණවලින් ලැබෙන ආදායම සම්බන්ධයෙන් මෙම වගන්තියෙහි විධිවිධාන අදාල වේ.

**21 වැනි වගන්තිය**

***ශිෂ්‍යයන් සහ අභ්‍යාසලාභීන්***

1. ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකකට පැමිණීමට පූර්වාසන්නයෙහි අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වූ හෝ වාසිකයෙකු වන, ස්වකීය අධ්‍යාපනය හෝ පුහුණුව යන කාර්යයන් සඳහා පමණක් පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින ශිෂ්‍යයෙකු, ආධුනිකයෙකු හෝ ව්‍යාපාර අභ්‍යාසලාභියෙකු ; ස්වකීය නඩත්තුව, අධ්‍යාපනය හෝ පුහුණුව සම්බන්ධ කාර්යයන් සඳහා ලැබූ ගෙවීම්, එම පළමු සඳහන් රාජ්‍යයෙන් පරිබාහිරව ඇති ප්‍රභවයන්ගෙන් සිදු කරන්නේ නම් එම පළමු සඳහන් රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ තාවකාලිකව සිටින විට සහ ඔහු පළමුව සඳහන් කරන ලද රාජ්‍යයෙහි වාසිකයෙකු හෝ සේවා නියුක්තිකයෙකු හෝ එවැනි වාසිකයෙකු සමග කොන්ත්‍රාත්තුවකට සම්බන්ධව සිටින තැනැත්තෙකු වන විට හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය මගින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් මගින් අනුග්‍රහය ලබා දෙන වැඩ සටහනකට සහභාගී වන්නන්,

(අ) පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු හෝ එවැනි වාසිකයෙකුට සම්බන්ධතාවයක් සහිත පුද්ගයෙකු හැර වෙනත් පුද්ගලයෙකු වෙතින් තාක්ෂණික විශේෂඥ හෝ ව්‍යාපාරික අත්දැකීම් ග්‍රහණය කර ගැනිම ; හෝ.

(ආ) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ විශ්ව විද්‍යාලයක හෝ වෙනත් පිළිගත් අධ්‍යාපන ආයතනයක අධ්‍යාපනය ලැබීමේ නියුක්ත වීම.

යන කරුණු මූලික අරමුණුකොට ඒ සඳහා සහභාගී වන විට එකී පුද්ගලයෙකු පෞද්ගලික සේවාවන්ගෙන් ලබන ආදායම වසකරට නොවැඩි කාලයක් සඳහා අනෙක් රාජ්‍යයේදී බද්දෙන් නිදහස් විය යුතු ය.

**22 වැනි වගන්තිය**

***වෙනත් ආදායම්***

1. මෙම ගිවිසුමෙහි පූර්ව වගන්තිවල සඳහන් නොවන ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට ආර්ථලාභී ලෙස හිමිව ඇති ආදායම් අයිතම එම ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැක්කේ එම ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයන් තුළ පිහිටි ප්‍රභවයන්ගෙන් උද්ගත නොවන්නේ නම් පමණක් වන අතර එකී ආදායම් අයිතම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ද බද්දට යටත් කළ හැකි ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වෙමින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී රාජ්‍යයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් රාජ්‍යයේ ස්වාධීන පෞද්ගලික සේවාවක් ඉටු කරයි නම් සහ ආදායම ගෙවනු ලබන අයිතිවාසිකම හෝ දේපළ ඉහත සඳහන් ස්ථිර ආයතනයට හෝ ස්ථාවර පදනමට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇති නම්, 6 වැනි වගන්තියේ 2 ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චල දේපළවලින් ලැබෙන ආදායම, නොවන ආදායමට මෙම වගන්තියෙහි 1 ඡේදයේ විධිවිධාන අදාල නොවේ. එබඳු අවස්ථාවන්හිදී 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන, අවස්ථාචෝචිත පරිදි අදාළ විය යුත්තේ ය.

3. ආදායම ගෙවනු ලන අයිතිවාසිකම් ඇති කිරීම හෝ පවරා දීම මගින් මෙම වගන්තියෙන් වාසි ලබා ගැනීම ; එසේ ඇති කිරිම හෝ පවරා දීම සඳහා සම්බන්ධ යම් පුද්ගලයෙකුගේ ප්‍රධාන පරමාර්ථය හෝ ප්‍රධාන පරමාර්ථ අතුරින් එකක් වන්නේ නම් ; එහිදී මෙම වගන්තියෙහි විධිවාධාන අදාල නොවේ.

23 වැනි වගන්තිය

*ද්වත්ව බදුකරණය ඉවත් කිරීම*

1. පලස්තීනයේ වාසිකයෙකු මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලංකාවේදී ආදායමක් උපයන විට, එම ආදායම ශ්‍රී ලංකාවේදී බද්දට යටත් කළ හැකි අතර, එම ආදායම මත ශ්‍රී ලංකාවේදී ගෙවිය යුතු බදු ප්‍රමාණය එම වාසිකයාට එකී ආදායම මත පලස්තීනයේදී පනවනු ලබන බදු ප්‍රමාණය සඳහා බදු බැරක් ලෙස ඉඩ දිය යුතු ය. කෙසේ වුව ද, එම බදු බැර එකී ආදායමට ආරෝපනය කළ හැකි පලස්තීන බද්දෙහි කොටස නොඉක්මවිය යුතු ය.

2. ශ්‍රී ලංකාවේ වාසිකයෙකු මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව පලස්තිනයේදී ආදායමක් උපයයන විට, එම ආදායම පලස්තීනයේදී බද්දට යටත් කළ හැකි අතර, එම ආදායම මත පලස්තීනයේදී ගෙවිය යුතු බදු ප්‍රමාණය එම වාසිකයාට එකි ආදායම මත ශ්‍රී ලංකාවේදී පනවනු ලබන බදු ප්‍රමාණය සඳහා බදු බැරක් ලෙස ඉඩ දිය යුතු ය. කෙසේ වුවද, එම බදු බැර එකී ආදායමට ආරෝපනය කළ හැකි ශ්‍රී ලංකා බද්දෙහි කොටස නොඉක්මවිය යුතු ය.

3. මෙම ගිවිසුමේ ඕනෑම විධිවිධායකට අනුකූලව ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් උපයනු ලබන ආදායම එකී රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් වන අවස්ථාවක එම රාජ්‍යය එවැනි වාසිකයෙකුගේ ඉතිරි ආදායම මත බදු ගණනය කිරීමේදී එසේ නිදහස් කරන ලද ආදායම සැළකිල්ලට ගත යුතු වේ.

24 වැනි වගන්තිය

*වෙනස් ලෙස නොසැලකීම*

1. එක් ගිවිසුම්කාර රාජ්‍යයක රට වැසියන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, වාසිකභාවය පිළිබඳව විශේෂිතව සමාන තත්ත්වයන් යටතේ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ රටවැසියන් කෙරෙහි බල පවත්නා යම් බදුකරණයකට හෝ සම්බන්ධිත අවශ්‍යතාවයකට වඩා වෙනස් වූ හෝ දුෂ්කර වූ බදුකරණයකට හෝ අවශ්‍යතාවයකට යටත් නොකරනු ලැබිය යුතු ය. (1 වැනි වගන්තියේ විධිවිධාන නොතකා ගිවිසුම්කාර රාජ්‍යයන් එකක හෝ දෙකෙහිම වාසිකයන් නොවන තැනැත්තන්ටද මෙම විධිවිධාන අදාල විය යුතු ය.)

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් සතු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයක් මත, එම කටයුතු වලම නියැලෙන අනෙක් රාජ්‍යයේ ව්‍යවසායන් සම්බන්ධයෙන් වන බදුකරණයට වඩා අවාසි සහගත වන පරිදි එකී අනෙක් රාජ්‍යයේදී බදු අය නොකළ යුතු ය. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් සිය වාසිකයන්ට සිවිල් තත්ත්වය හෝ පවුලේ වගකීම් හේතු කොටගෙන බදු කාර්යය සඳහා දෙනු ලබන පෞද්ගලික දීමනා, සහන සහ අඩු කිරීම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ට ලබා දීමට මෙම විධිවිධානය බැඳී ඇතැයි යනුවෙන් තේරුම් නොගත යුතු ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායන්හි ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් වශයෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු හෝ වාසිකයන් වැඩි දෙනෙකු විසින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් අයත් කර ගෙන සිටින කල්හි හෝ පාලනය කරනු ලබන කල්හි, එකී පළමුව සඳහන් රාජ්‍යයේ එබඳු වෙනත් ව්‍යවසායන් යටත්වන හෝ යටත් කළ හැකි වන බදුවලට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට වඩා වෙනස් වූ හෝ ඉසිලීමට වඩා දුෂ්කර වූ කිසිදු බද්දකට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට එකී පළමුව සඳහන් රාජ්‍යයෙහිදී යටත් කරනු නොලැබිය යුතු ය.

4. මෙම ගිවිසුමෙහි "බදුකරණය" යන පදයෙන් මෙම ගිවිසුමට විෂය වන්නා වූ බදු අදහස් කෙරේ.

25 වැනි වගන්තිය

*අන්‍යෝන්‍ය එකඟත්ව ක්‍රියාපිළිවෙළ*

1. ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙන් එකක හෝ දෙකෙහිම ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූල නොවන අයුරින් තමා බදුකරණයට පාත්‍රවන්නේ යයි හෝ එසේ පාත්‍රවී ඇතැයි යම් ගිවිසුම්කාර රාජ්‍යයක තැනැත්තෙකු සලකන අවස්ථාවක, එකී රාජ්‍යයන්හි අභ්‍යන්තර නීති මගින් සලසා ඇති විධිවිධානයන් නොසලකා ඔහු වාසිකයකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා වෙත හෝ ඔහුගේ විෂය 24 වැනි වගන්තියේ 1 වැනි ඡේදය යටතට පත්වේ නම්, ඔහු රටවැසියෙකු වන රාජ්‍යයේ නිසි බලධරයා වෙත කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකිය. මෙම ගිවිසුමෙහි විධිවිධානවලට අනුකූල නොවන බදුකරණය ප්‍රතිඵලයක් වීමට හේතුවන ක්‍රියාව පිළිබඳ ප්‍රථම දැන්වීමෙන් වර්ෂ තුනක් ඇතුළත එකී කරුණු ඉදිරිපත් කිරීම කළ යුතු ය.

2. විරෝධතාවය යුක්ති සහගත යයි නිසි බලධරයාට පෙනී යන්නේ නම් සහ තනිව යෝග්‍ය විසඳුමක් කරා එළඹීමට ඔහු අපොහොසත් වන්නේ නම්, මෙම ගිවිසුමට අනුකූල නොවන බදුකරණය වළක්වාලීමේ අදහසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා සමග අන්‍යොන්‍ය එකඟත්වයෙන් තත්ත්වය නිරාකරණය කර ගැනීමට ඔහු උත්සාහ කළ යුතු ය.

3. මෙම ගිවිසුම අර්ථ නිරූපණය කිරීම හෝ අදාළ කිරීම සම්බන්ධයෙන් යම් දුෂ්කරතාවයක් හෝ සැකයක් පැන නගී නම් ඒවා අන්‍යොන්‍ය එකඟත්වයෙන් නිරාකරණය කර ගැනීමට ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන් උත්සහා කළ යුතු ය. මෙම ගිවිසුමෙහි විධිවිධාන සලසා නොමැති අවස්ථාවන්හිදී ද ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සඳහා ඔවුන් සාමූහිකව සාකච්ඡා කළ යුතු ය.

4. පෙරාතු ඡේදවල අර්ථ සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹීමේ කාර්යය සඳහා ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන්ට කෙළින්ම එකිනෙකා අතර අදහස් හුවමාරු කරගත හැකිය. මෙම වගන්තියේ සඳහන් අන්‍යොන්‍ය එකඟතා ක්‍රියා පරිපාටිය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධාරීන්ට උපදේශකයන් හරහා, සුදුසු ද්විපාර්ශික ක්‍රියා පරිපාටින්, කොන්දේසි, විධි ක්‍රම සහ ශිල්ප ක්‍රම උපදෙස් ලබා ගැනීමෙන් වැඩි දියුණු කළ යුතු ය.

**26 වැනි වගන්තිය**

***තොරතුරු හුවමාරු කර ගැනීම***

1. මෙම ගිවිසුමෙහි විධිවිධානයන් සහ ගිවිසුමෙන් ආවරණය වන බදුවලට අදාළව ගිවිසුම්කාර රාජ්‍යයන්හි පවතින දේශීය නීති, එකී නීති යටතේ කෙරෙන බදුකරණය මෙම ගිවිසුම ප්‍රතිවිරුද්ධ නොවන තාක් දුරට ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම එම බදු සම්බන්ධයෙන් වූ බදු ගෙවීම මග හැරීම වැළකීම සඳහාත් අවශ්‍ය වන තොරතුරු ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධාරීන් විසින් හුවමාරු කර ගත යුතු ය. තොරතුරු හුවමාරු කර ගැනීම 1 වැනි වගන්තියෙන් සීමා නොවේ. ගිවිසුම්කාර රාජ්‍යයන් විසින් හුවමාරු කර ගනු ලබන යම් තොරතුරක් එම රාජ්‍යයේ දේශීය නීති යටතේ ලබා ගත් තොරතුරු රහස්‍ය සේ සලකන ආකාරයටම රහස්‍ය සේ සැලකිය යුතු අතර, එම තොරතුරු මෙම ගිවිසුමට විෂය වන බදු තක්සේරු කිරීම හා රැස් කිරීම, එම බදු හා අදාල බලාත්මක කිරීමක් හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමක් හෝ එම බදු සම්බන්ධ වන අභියාචනයන් නිර්ණය කිරීම හා සම්බන්ධ වූ තැනැත්තන් හෝ බලධරයන්ට (උසාවි හා පරිපාලන මණ්ඩල ද ඇතුළුව) පමණක් හෙළිදරව් කළ යුතු වේ. එවැනි තැනැත්තන් හෝ බලධාරීන් එකී කාර්යයන් සඳහා පමණක්ම එම තොරතුරු යොදා ගත යුතු නමුත්, ප්‍රසිද්ධ උසාවි කටයුතු වලදී හෝ අධිකරණ තීන්දුවලදී එම තොරතුරු හෙළි කළ හැකි ය.

2. 1 වැනි ඡේදයේ විධිවිධාන මගින් ගිවිසුම්කාර රාජ්‍යයන් මත පහත සඳහන් බැඳීම් පනවන්නේ යැයි කිසිදු අවස්ථාකදී අදහස් නොකළ යුතු ය.

(අ) එම ගිවිසුම්කාර, රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති හෝ පරිපාලනමය භාවිතයන් සමග වෙනස් වන ආකාරයට පරිපාලනමය විධිවිධාන යොදා ගැනීම ;

(ආ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ හෝ සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලියේදී ලබාගත නොහැකි විස්තර සැපයීම ;

(ඇ) යම් වෙළඳ, ව්‍යාපාරික, කාර්මික, වාණිජ හෝ වෘත්තීය රහසක් හෝ වෙළෙඳ ක්‍රියාවලියක් හෝ තොරතුරක් එළිදරව් කරන තොරතුරක් හෝ එසේ එළිදරව් කිරීම රජයේ ප්‍රතිපත්තියට පටහැනි වන යම් තොරතුරක් සැපයීම.

**27 වැනි වගන්තිය**

***රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයන් සහ කොන්සල් තනතුරු***

ජාත්‍යන්තර නීතිය පිළිබඳ පොදු නීති රීති යටතේ හෝ විශේෂ ගිවිසුම්වල විධිවිධාන යටතේ රාජ්‍ය තාන්තික දූත මණ්ඩල සාමාජිකයන්ට හෝ කොන්සල් තනතුරුවලට අයත් මූල්‍ය වරප්‍රසාද කෙරෙහි මෙම ගිවිසුමේ කිසිවක් බල නොපෑ යුතු ය.

**28 වැනි වගන්තිය**

***බදු රැස්කිරීමේදී සහාය***

1. ආදායම් හිමිකම් රැස්කිරීමේදී ගිවිසුම්කාර රාජ්‍යයන් එකිනෙකට සහාය දැක්විය යුතුය. මෙම ගිවිසුමෙහි 1 වැනි සහ 2 වැනි වගන්ති මගින් මෙම සහාය සීමා කිරීමක් සිදු නොකරයි. මෙම වගන්තිය අදාළ කර ගන්නා ආකාරය ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟතාවය මත තීන්දු කරනු ඇත.

2. මෙම වගන්තියෙහි යොදා ඇති ආකාරයට "ආදායම් හිමිකම" යනුවෙන් අදහස් වනුයේ ගිවිසුම්කාර රාජ්‍යයක හෝ එහි දේශපාලන උපකොට්ඨාශයේ හෝ පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් පනවා ඇති සෑම ආකාරයේම සහ විස්තරයක බදු සම්බන්ධයෙන් අයත් වන්නා වූ මුදල වන අතර, ඒ යටතේ වූ බදුකරණය මෙම ගිවිසුම හෝ ගිවිසුම්කාර රාජ්‍ය පාර්ශවයන් වන්නා වූ ඕනෑම නීත්‍යානුකූල ලේඛනයකට මෙන්ම එකී මුදලකට අදාලව, පොළිය පරිපාලන දණ්ඩන සහ රැස්කිරීමේ හෝ සුරැකීමේ පිරිවැයකට පටහැනි නොවන තාක්දුරට විය යුතු ය.

3. ගිවිසුම්කාර රජ්‍යයක ආදායම් හිමිකමක් එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ බලාත්මක කළ හැකි අවස්ථාවකදී සහ එම අවස්ථාවේදී එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ එම ආදායම අයකිරීම වැළැක්විය නොහැකි තැනැත්තකු විසින් එම ආදායම් හිමිකම ගෙවිය යුතුව ඇති කල්හි, එම ආදායම් හිමිකම එම ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධාරියාගේ ඉල්ලීම පරිදි අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධාරියා විසින් අයකිරීමේ කාර්යයන් සඳහා භාරගත යුතු වේ. එම ආදායම් හිමිකම එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ආදායම් හිමිකමක් සේ සලකා තම රාජ්‍යයේ බදු බලාත්මක කිරීමට හා අයකිරීමට අදාළ එම රාජ්‍යයේ නීතිවල විධිවිධානයන්ට අනුකූලව එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් අයකර ගත යුතු ය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක ආදායම් හිමිකමක් එම රාජ්‍යයේ නීති යටතේ එම හිමිකම අයකර ගැනීම සහතික කිරීමේ අරමුණින් සුරැකුම් ක්‍රියා මාර්ග ගත හැකි කල්හි, එම ආදායම් හිමිකම එම ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධාරියාගේ ඉල්ලීම පරිදි සුරැකුම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධාරියා විසින් භාර ගනු ලැබිය යුතු ය. එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් එවැනි ක්‍රියා මාර්ග යොදා ගනු ලබන අවස්ථාවේදී, පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ ආදායම් හිමිකම බලාත්මක කළ නොහැකි හෝ එකී ආදායම් හිමිකම අයකිරීම වැළැක්වීමට අයිතියක් ඇති තැනැත්තෙකු විසින් ගෙවිය යුතු වුවද, එම ආදායම් හිමිකම එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ආදායම් හිමිකමක් සේ සලකා එම රාජ්‍යය සිය නීතිමය විධිවිධානයන්ට අනුකූලව එකී ආදායම් හිමිකමට ආදළව එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය සුරැකුම් ක්‍රියා මාර්ග ගත යුතු ය.

5. 3 වැනි සහ 4 වැනි ඡේදවල විධිවිධාන නොසලකා, 3 වැනි හෝ 4 වැනි ඡේදවල කාර්යයන් සඳහා ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් පිළිගනු ලැබ ඇති ආදායම් හිමිකමක් කාල සීමාවන්ට යටත් කිරීම හෝ එම ආදායම් හිමිකමේ ස්වභාවයේ හේතුව මත එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ ආදායම් හිමිකමට බලපාන යම් ප්‍රමුඛතාවක් ලබාදීම හෝ නොකළ යුතු ය. මීට අමතරව, 3 වැනි හෝ 4 වැනි ඡේදවල කාර්යයන් සඳහා ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් පිළිගනු ලැබ ඇති ආදායම් හිමිකමට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ බලපැවැත්වෙන යම් ප්‍රමුඛතාවයක් පෙර කී ගිවිසුම්කාර රාජ්‍යයේදී ලබා නොදිය යුතු ය.

6. ගිවිසුම්කාර රාජ්‍යයක ආදායම් හිමිකමක පැවැත්ම, වලංගුභාවය හෝ ප්‍රමාණය පිළිබඳ නීතිමය කටයුතු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි උසාවි හෝ පරිපාලන මණ්ඩල ඉදිරියට ගෙන ආ යුතු නැත.

7. 3 වැනි හෝ 4 වැනි ඡේද යටතේ ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් ඉල්ලීමක් කිරීමෙන් පසුව සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය අදාළ ආදායම් හිමිකම අයකරගෙන මුලින් කී ගිවිසුම්කාර රාජ්‍යයට ප්‍රේෂණය කිරීමට පෙර පහත සඳහන් අවස්ථාවන්හිදී පළමු සඳහන් රාජ්‍යයේ ආදායම් හිමිකම අවසන් විය හැක.

(අ) 3 වැනි ඡේදය යටතේ ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී, පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ බලාත්මක කළ හැකි සහ එම අවස්ථාවේදී එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ එකී අය කිරීම වැළැක්විය නොහැකි තැනැත්තකු විසින් ගෙවීමට බැඳී සිටින ආදායම් හිමිකමක් ඇති විටක හෝ ;

(ආ) 4 වැනි ඡේදය යටතේ ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී එකී අය කිරීම සහතික කිරීමේ අරමුණින් එකී පළමු සඳහන් රාජ්‍ය විසින් එහි පවතින් නීති යටතේ සුරැකුම් ක්‍රියා මාර්ග ගනු ලබන ආදායම් හිමිකමක් සම්බන්ධයෙන් ;

(ඇ) මේ පිළිබඳව පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධාරියා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධාරියාට නියමිත පරිදි දැන්විය යුතු අතර අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ මනාපය මත පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යය සිය ඉල්ලීම අත්හිටුවීම හෝ ඉල්ලා අස්කර ගැනීම කළ යුතු ය.

9. මෙම වගන්තියේ විධිවිධාන මගින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගිවිසුම්කාර රාජ්‍යයක් මත බැඳීම් පනවන්නේ යැයි කිසිදු අවස්ථාවකදී අදහස් නොකළ යුතු ය.

(අ) එම රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති සහ පරිපාලන ක්‍රියාපිළිවෙතට වෙනස්වූ පරිපාලන ක්‍රම ක්‍රියාවේ යෙදවීම ;

(ආ) රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන ක්‍රියා මාර්ග ;

(ඇ) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් අවස්ථාවෝචිත පරිදි අය කිරීම හෝ සුරැකීම සම්බන්ධයෙන් එහි බල පවත්නා නීති හෝ පරිපාලන ක්‍රියා මාර්ග යටතේ පවතින සියළුම සාධාරණ ක්‍රියා මාර්ග ගෙන නොමැති අවස්ථාවකදී සහාය දීම ;

(ඈ) එම ගිවිසුම්කාර රාජ්‍යය සඳහා වූ පරිපාලන කාර්යභාරය, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී පැන නගිනු ලබන ප්‍රතිලාභ වලට පැහැදිලි ලෙසම විසමානුපාතික වන අවස්ථාවන්හිදී සහය දීම.

**29 වැනි වගන්තිය**

***බලාත්මක කිරීම***

1. මෙම ගිවිසුම බලාත්මක කිරීම සඳහා ස්වකීය නීතිය මගින් අවශ්‍ය කෙරෙන කාර්ය පටිපාටි සම්පූර්ණ කර ඇති බව, එක් එක් ගිවිසුම්කාර රාජ්‍ය විසින් රාජ්‍ය තාන්ත්‍රික මාර්ගයන් හරහා අනෙක් රාජ්‍යයට දන්වා සිටිය යුතු ය. මෙම දැනුම්දීම අතරින් පසුව කෙරෙන දැනුම් දීමේ සිට මෙම ගිවිසුම බලාත්මක විය යුතු ය.

2. මෙම ගිවිසුමේ විධිවිධාන :

(අ) ප්‍රභවයේදී රඳවා ගත් බදු සම්බන්ධයෙන් ගිවිසුම බලාත්මක වන දිනට පසුව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසුව උත්පාදනය වන ආදායම වෙනුවෙන් ; සහ

(ආ) අනෙකුත් ආදායම් මත බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වන වර්ෂයට පසුව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි වර්ෂයක් වෙනුවෙන් ;

බලපැවැත්විය යුතු ය.

**30 වැනි වගන්තිය**

***අවසන් කිරීම***

යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් අවසන් කරනු ලබන තෙක් මෙම ගිවිසුම බලපැවැත්විය යුතු වේ. ගිවිසුම බලාත්මක වන දිනයේ සිට වසර පහක කාල පරිච්ඡෙදයකින් පසුව එළඹෙන ඕනෑම ලිත් වර්ෂයක් අවසන් වීමට අවම වශයෙන් මාස හයකට පෙර හෝ ඉන් පෙර රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා ;

(අ) ප්‍රභවයේදී රඳවා ගනු ලබන බදු සම්බන්ධයෙන්, මෙම ගිවිසුම අවසන් කිරීම පිළිබඳව නිවේදනය කරන ලද වර්ෂයට ඉක්බිතිව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමු වන දින හෝ ඉන්පසුව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින හෝ ඉන්පසුව වන ආදායම් සම්බන්ධයෙන් ; සහ

(ආ) අනෙකුත් ආදායම් මත බදු සම්බන්ධයෙන්, එකී නිවේදනය සිදු කරන ලද වර්ෂයට පසුව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි වර්ෂයක් සඳහා අය කළ හැකි බදු සම්බන්ධයෙන් ;

මෙම ගිවිසුම ක්‍රියාත්මක වීම අවසන් වන්නේ ය.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය ලැබූ පහත අත්සන් කරන අය මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

එක හා සමාන ලෙස බල සහිත වන සියලුම පාඨයන්ගෙන් යුතුව, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් දෙපිටපතකින් යුතුව 2012 අප්‍රේල් මස 16 වන දින කොළඹදී අත්සන් තබන ලදී. අර්ථ නිරූපනයේදී ප්‍රතිවිරුද්ධ අවස්ථා ඇති වුවහොත්, ඉංග්‍රීසි පිටපත බල පැවැත්විය යුතු ය.

| | |
|---|---|
| මහාචාර්ය ජී. එල්. පීරිස්<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී<br>ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන් | ආචාර්ය රියාඩ් මල්කි<br>පලස්තීන රාජ්‍යය<br>වෙනුවෙන් |

12 - 506

2—PG 1852 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.